02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයක් ලෙස සැළකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැළකිය යුතු ය.

05. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01 ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

06. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

08. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2023 පෙබරවාරි** මස **27** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 ජනවාරි මස 04 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කොළඹ | තිඹිරිගස්යාය | ද සොයිසා කාන්තා රෝහල් කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ |
| කොළඹ | තිඹිරිගස්යාය | ජාතික රෝහල (i) කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ |

01-246

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2023 පෙබරවාරි මස 27 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 ජනවාරි මස 03 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | කොත්මලේ | පල්ලේපනේ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා කොත්මලේ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |

01-245

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**මහනුවර දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුව I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2023 පෙබරවාරි මස 27 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 ජනවාරි මස 03 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | උඩපලාත | උඩපලාත කොට්ඨාසයේ මාවතුර ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

01-244

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ජාතික විගණන කාර්යාලයේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2023

ජාතික විගණන කාර්යාලයේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩුව පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. බඳවා ගැනීමේ ක්‍රමය :- නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

   පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2. අවශ්‍ය සුදුසුකම් :

   (i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :-
   ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

   (ii) පළපුරුද්ද :-
   ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයෙකු වශයෙන් වසර තුන (03) කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය, දිනය හා නිලමුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.)

   හෝ

   ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක* වසර තුන (03) කට නොඅඩු පළපුරුද්ද ලබා තිබීම.

*සටහන* : මූලික සුදුසුකම් සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය. සේවා කාලය ආරම්භ වන හා අවසාන වන දිනය පැහැදිලිව සඳහන් කර නොමැති සහ සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

* නීතිමය තනතුරක් යනු නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වන තනතුරු ය.

   (iii) කායික යෝග්‍යතාව :-

   සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

   (iv) වෙනත් සුදුසුකම් :-

   - ශ්‍රී ලාංකික පුරුවැසියෙකු විය යුතුය.
   - අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
   - අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. සේවය නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත් වී වසර තුනක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v) ඉල්ලුම් කරනු ලබන භාෂා මධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

4. වයස් සීමාව :
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

5. වැටුප් පරිමාණය :
2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 – 110,895 (SL-1-2016) වේ

6. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| අනු. අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 25 | |
| | (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක් | 20 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද, | | 25 |
| | ● පළමු පංතියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 15 | |
| | ● දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 10 | |
| | ● පන්ති සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 07 | |
| | ● සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 05 | |
| | (ඇ) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය | 05 | |
| | සටහන I : නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 05 ලබා දෙනු ලැබේ.<br>සටහන II : ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |

<table>
<tr><th>අනු. අංකය</th><th>විෂය</th><th>ලකුණු</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td>02</td><td>අතිරේක පළපුරුද්ද<br>නඩුවලට අදාළ ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ කරුණු දැක්වීම්
<table>
<tr><th></th><th>නඩු ගොනු කිරීම් (එක් නඩුවක් සඳහා)</th><th>අධිකරණය ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීම් සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා)</th></tr>
<tr><td>ශ්‍රේෂ්ඨාධිකරණය</td><td>2</td><td>5</td></tr>
<tr><td>අභියාචනාධිකරණය</td><td>2</td><td>4</td></tr>
<tr><td>මහාධිකරණය</td><td>2</td><td>3</td></tr>
<tr><td>දිස්ත්‍රික් උසාවි</td><td>4</td><td>5</td></tr>
<tr><td>විනිශ්චයාධිකාර</td><td>2</td><td>3</td></tr>
</table>
සටහන<br>● ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදළ නඩු තීන්දුවල පිටපත් හෝ අවසන් වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ සහතික පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.</td><td></td><td>35</td></tr>
<tr><td>03</td><td>තොරතුරු තාක්ෂණය/තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම<br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා<br>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක්<br>(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්<br>(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදරා/පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ලබාගත් සහතික පත්‍ර. (එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.)<br><br>සටහන :- ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.</td><td>10<br>08<br>05<br>04</td><td>10</td></tr>
<tr><td>04</td><td>භාෂා හැකියාව :<br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත් උපාධිය<br>(ආ) පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරගවලදී (Moot court competitions) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව<br><br>කේවල<br>i. ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාව - 12<br>ii. දෙවන ස්ථානය - 10<br>iii. තෙවන ස්ථානය/වෙනත් කුසලතා 08<br><br>කණ්ඩායම්<br>i. ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාව - 10<br>ii. දෙවන ස්ථානය - 08<br>iii. තෙවන ස්ථානය/වෙනත් කුසලතා - 06</td><td>15<br>12</td><td>15</td></tr>
</table>

| අනු. අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්.<br>(ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ IELTS සමස්ථ ලකුණු 6.5 හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ වීම<br>(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් NVQ 4 මට්ටමේ සහතිකයක්<br>**සටහන** : ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ. | 10<br><br>08<br><br>05 | |
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය :<br>තනතුරෙහි භූමිකාව ඉටුකිරීමට උපස්ථම්භවන අයදුම්කරුගේ :<br>o ශක්තීන් (Strength questions) (ලකුණු 02)<br>o අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව (Situational questions) (ලකුණු 03) හා<br>o දක්ෂතාවය (Competency questions) (ලකුණු 10)<br>ඇගයීමට ලක් කිරීම අරමුණු කර ගත් ප්‍රශ්නවලට ලබා දෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ. | | 15 |
| | එකතුව | | 100 |

7. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකපත්‍රවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

8. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :

(i) අයදුම්පත් **2023.02.27 වැනි දිනට** හෝ ඊට ප්‍රථම ''විගණකාධිපති'', ජාතික විගණන කාර්යාලය, අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 03 දක්වාත් දෙවැනි පිටුව 04 සිට 06 දක්වාත් තෙවැනි පිටුව 07 සිට 09 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''විධායක සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයෙකු හෝ රු. 47,615.00 ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

9. සාවද්‍ය තොරතුරු සැපයීම :
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩුව පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

11. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

විගණකාධිපති.

2023 ජනවාරි මස 19 වැනි දින,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72,
පොල්දූව පාර, බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

ජාතික විගණන කාර්යාලයේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම -2023

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න. සිංහල - 2/දෙමළ-3 /ඉංග්‍රීසි- 4)

*සටහන* :- අයදුම් කරන මාධ්‍ය වෙනස් කළ නොහැක.

1.0

1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 මුලකුරු සමග නම (මයා/මිය/මෙය) :————.
(සිංහලෙන්/දෙමළෙන්)
උදා : එම්. ජී. බී. එස්. කේ. ගුණවර්ධන

1.4 මුලකුරු සමග නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.0

2.1 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0

3.1 ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐
(පුරුෂ - 0 ස්ත්‍රී - 1)

3.2 විවාහක/අවිවාහක බව (අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐
(විවාහක - 1 අවිවාහක - 2)

3.3 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.4 2023.02.27 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.5 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

4.0 දුරකථන අංකය : ස්ථාවර ☐☐☐☐☐☐☐☐☐☐

ජංගම ☐☐☐☐☐☐☐☐☐☐

5.0

5.1 සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව ලබා ගෙන ඇති සුදුසුකම් පිළිබඳ විස්තර :

| *සුදුසුකම් ලබාගත් ආයතනය* | *ලබාගත් දිනය* |
|---|---|
| ....................................... | ..................... |
| ....................................... | ..................... |

* ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දුන් දිනය :—————.

* මූලික සුදුසුකම් සනාථ කෙරෙන සහතික/ලේඛන අයදුම්කරු විසින්ම සත්‍ය බවට සහතික කර අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර :-

5.2 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :—————.

5.3 අතිරේක වෘත්තීය පළපුරුද්ද :—————.

5.4 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :—————.

5.5 භාෂා හැකියාව :—————.

* අතිරේක සුදුසුකම් සනාථ කෙරෙන ලේඛන අයදුම්පත හා එවිය යුතු නොවන අතර, එම ලේඛන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීමට සූදානම් කර තබා ගැනීම අයදුම්කරුගේ වගකීමකි.

6.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

| නැත | | ඔව් | |
|---|---|---|---|

(අදාළ කොටුවේ ලකුණ (✓) යොදන්න) (ඔව් නම් විස්තර කරන්න)

..........................................................................................................................

7.0 අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................. මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිට දී, ............... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය :————.

සම්පූර්ණ නම :————.
තනතුර :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :

ඉහත විස්තර සඳහන් ..................................................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාව යොදන්න)

01-301

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ජනමාධ්‍ය අමාත්‍යාංශය

**රැකියා සුලභ මුද්‍රණ සහ ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට පිවිසෙන්න**

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2023**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව**
**NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000

**මයික්‍රොසොෆ්ට් ඔෆීස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 22,000 NVQ සහතිකපත් පාඨමාලාව රු. 31,000

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 06 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing**
**පොත් බැඳීම - Book Binding - NVQ 4**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක්, න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව තුළින් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයකි.

පාඨමාලා කාලය : මාස 06 - මාස 08 මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000
NVQ පාඨමාලාව : රු. 65,000

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 26,000

**ත්‍රිමාණ සජීවීකරණය - Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000

**පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම - Computer Hardware & PC Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර එදිනෙදා පැන නගින දෘඩාංග/මෘදුකාංගවලට අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්ෂණයේ නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එක සේ ප්‍රයෝජනවත් වනු ඇත.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.19,000

**ඕෆ්සෙට් පත් ලිතෝකරණය - Sheetfed Offset Printing**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුළත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 26,000

**නවීන වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
**Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්ත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගීවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස්ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණකරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායි පුහුණුවකි.

පාඨමාලා කාලය : මාස 03යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 30,000

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ නවීනතම මුද්‍රණ තාක්ෂණය වන ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - Design for Print**

මුද්‍රණ රටා නිර්මාණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටළු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබාදේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 17,000

**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනය වන අයුරින් මෙහි විෂය මාලාව සකස් කර ඇති අතර මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික්ස් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 01යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 50,000

**මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Print Packaging Technology**

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ මුල සිට අග දක්වා විස්තරාත්මකව දැනුම සහ පුහුණුව ලබා දේ. දැනුම පුළුල්වන අයුරින් ඇසුරුම් ආයතනවලට පුහුණුකරුවන් රැගෙන ගොස් විශේෂ දේශන පැවැත්වීම ද, මෙම පාඨමාලාව අන්තර්ගතය තුළ සකසා ඇත. මෙම පාඨමාලාව ඇසුරුම්කරණ ආයතනවල නියැළි පුද්ගලයන්ට මෙන්ම මෙම ක්ෂේත්‍රයට උනන්දුවන නවකයන්ට ද සුදුසු අයුරින් සරලව අන්තර්ගතය සකස් කර ඇත.

කාලය : වසර 1යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,750

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරණ සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.

දුරකථන : 0112686162, 0112679791, 0719716655
ෆැක්ස් : 011 2686162
ඊ-මේල් : sliopdir@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශාඛා : ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, මාතලේ ශාඛාව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.
දුරකථන : 0662222172, 071 0554298

01-000

## හෝමියෝපති වෛද්‍ය සභාව

හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා වූ විභාගය - 2023

**2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30(3) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි**

හෝමියෝපති පනතේ 30(1) වගන්තිය යටතේ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින් වශයෙන් ලියාපදිංචි වීම සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් වෙනුවෙන්

2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30(2) වගන්තිය යටතේ,

2023 ජනවාරි 16 දින සිට 20 දින දක්වාත් ජනවාරි 23 දින සිට 26 දින දක්වා පැවැත්වීමට නියමිතව තිබූ ලිඛිත විභාගය

2023 පෙබරවාරි 06 දින සිට 1 දින දක්වාත් පෙබරවාරි 13 දින සිට 16 දින දක්වා යන දිනයන්වලට කල් දැමූ අතර එම විභාගය 2023 පෙබරවාරි 06 දින සිට අංක 144, සිරි ධම්මාරාමය, හයිලෙවල් පාර, නුගේගොඩ දී පෙ. ව. 9.00 සිට ප. ව. 4.00 දක්වා පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙමි.

ලේඛකාධිකාරී,
හෝමියෝපති වෛද්‍ය සභාව.

අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත,
වැලිසර,
රාගම.

01-341

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය - 2023

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් බඳවා ගැනීමට සුදුසුකම්ලත් ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications - Institutional Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් තම අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, ආයතන ප්‍රධානියාගේ සහතිකය, සමග අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව. තැ. පෙ. 1503, කොළඹ" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය - 2023**" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2023.02.10** දින වේ. මෙම විභාගය **2023 මාර්තු** මස පවත්වනු ලැබේ.

> ***සටහන 1.-*** අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් මඟින් එවීම අනිවාර්ය වන අතර එය තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් ම විඳදරා ගත යුතුය.

02. ***සේවයට බඳවා ගැනීමේ ක්‍රමය*** :

2.1 මේ සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් මෙම *ගැසට්* නිවේදනයේ 10.1 වගන්තිය පරිදි ලිඛිත තරග විභාගයක් පවත්වනු ලැබේ.

2.2 ලිඛිත තරග විභාගයේ සියලු ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් වූ අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතා අනුපිළිවෙළට අදාළ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණය(02) කට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම *ගැසට්* නිවේදනයේ 10.2 වගන්තිය පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයින්ගේ නාමලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. (සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

2.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී මූලික සුදුසුකම් සපුරනු ලැබූ අයදුම්කරුවන් මෙම *ගැසට්* නිවේදනයේ 10.3 වගන්තිය අනුව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු අධ්‍යාපන අමාත්‍යාංශය/අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා විසින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත සෘජුව යොමු කරනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණ අවස්ථාවේ දී අයදුම්කරුවන්ට අදාළ පුරප්පාඩු ලේඛනය ප්‍රදර්ශනය කරනු ලබන අතර අයදුම්කරුවන් විසින් පුරප්පාඩු පවතින පාසල් සඳහා ස්වකීය මනාපය ප්‍රමුඛතා අනුපිළිවෙළින් දැක්විය යුතුය.

2.4 ප්‍රායෝගික පරීක්ෂණයේ දී හා ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ, ඉල්ලුම් කර ඇති භාෂා මාධ්‍යය, විෂය හා පාසල්

වර්ගය අනුව පාසල් පාදකව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

2.5 මෙම *ගැසට්* නිවේදනයට අදාළ පත්වීම් විෂයන් හි පුරප්පාඩු උපලේඛනය 05හි සඳහන් වේ. උපලේඛනයේ සඳහන් ගුරු පුරප්පාඩු සඳහා පමණක් බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

*සටහන 2.-* එකම පාසලට මනාපය පළ කර ඇති අයදුම්කරුවන් කිහිප දෙනකු සමාන ලකුණු ලබා තිබෙන අවස්ථාවක දී පාසල් සඳහා ස්ථාන ගත කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින්/අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2.6 මෙම බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ පාසල් පාදක පුරප්පාඩු පදනම් කරගනිමින් වන බැවින් වසර පහ (05) ක් ගත වනතුරු කිසිදු අයුරකින් ස්ථාන මාරුවීම් ලබා දෙනු නොලැබේ.

2.7 මෙම බඳවා ගැනීමේ දී ජාතික හා පළාත් පාසල් වශයෙන් වෙන් වෙන් වශයෙන් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

2.8 ඔබට ජාතික පාසල්, පළාත් යන පාසල් වර්ග දෙක (02) සඳහා ම හෝ එක් පාසල් වර්ගයක් සඳහා හෝ තම මනාපය ප්‍රකාශ කළ හැකිය. ඒ බව අයදුම්පතෙ හි පැහැදිලිව සඳහන් කළ යුතුය.

2.9 ජාතික පාසල්/පළාත් පාසල් හා පළාත් පාසල් සඳහා පමණක් මනාපය ප්‍රකාශ කරනු ලබන අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල ඔවුන් විසින් අයදුම්පතෙ හි සඳහන් කරනු ලබන ස්ථිර පදිංචි පළාත අනුව ඒ ඒ පළාත් සඳහා යොමු කරනු ලැබේ. ස්ථිර පදිංචි පළාත ලෙස සැලකෙනුයේ 2022 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනය අනුව ලියාපදිංචි පළාත වේ. (ජාතික පාසල් සඳහා පමණක් අයදුම්කරනු ලබන අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල පළාත් සඳහා යොමු කරනු නොලැබේ.)

2.10 සෑම අයදුම්කරුවකු සඳහා ම පහත කරුණු අදාළ කර ගනු ලැබේ.

2.10.1 සෑම අයදුම්කරුවකුම ඔවුන් ඉල්ලුම් කරනු ලබන ජාතික/පළාත් පාසල අනුව ඉල්ලුම් කරනු ලබන විෂයට හා මාධ්‍යයට අදාළව පුරප්පාඩු නොපවතින අවස්ථාවක දී සලකා බැලීම සඳහා ස්ථිර පදිංචි පළාතට අමතරව අතිරේක පළාතක් ඉල්ලුම් කළ හැකිය. ඒ අනුව ඒ අතිරේක පළාත අයදුම්පතෙ හි පැහැදිලි ව සඳහන් කළ යුතුය.

2.10.2 එසේ ඉල්ලුම් කරනු ලබන අතිරේක පළාත සලකා බලනුයේ ඉල්ලුම් කරනු ලබන විෂයට හා මාධ්‍යයට ජාතික/පළාත් පාසල් පුරප්පාඩු නොමැති අවස්ථාවලදී පමණි.

2.10.3 මෙහි දී අතිරේක පළාත තුළ පවතින ගුරු පුරප්පාඩු සඳහා පළාත තුළ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම් සිදුකර තවදුරටත් පුරප්පාඩු පවතින්නේ නම් පමණක් මෙම අයදුම්කරුවන් සඳහා අවස්ථාව ලබා දෙනු ලැබේ.

*සැ.යු. :-* නැගෙනහිර පළාත තුළ ස්ථිර පදිංචි අයදුම්කරුවන් නොවන අයදුම්කරුවන් සඳහා අයදුම් කළ හැකි වනුයේ නැගෙනහිර පළාතේ විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි, තොරතුරු තාක්ෂණය, තාක්ෂණ විෂය ධාරාව හා උපදේශනය යන විෂයන් සඳහා පමණි.

03. ***සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි*** :

3.1 මෙම පත්වීම් තාවකාලික පත්වීම් වේ. වසර එකක (01) පූර්ව සේවා පුහුණු පාඨමාලාව ඇතුළුව වසර තුන (03) ක පූර්ව සේවා කාලයකට යටත්ව මෙම තාවකාලික පත්වීම් ලබා දෙනු ලැබේ.

3.2 පත්වීම් ලබා උක්ත පූර්ව සේවා පුහුණු පාඨමාලාව සම්පූර්ණ කරන අයදුම්කරුවන් හට වසර 3ක් අවසානයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

3.3 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම තාවකාලික පත්වීම යටත්වේ.

04. ***වැටුප/වැටුප් පරිමාණය*** :

4.1 මෙම තාවකාලික පත්වීම් සඳහා සුදුසුකම් ලබන්නන් හට බඳවා ගැනීම් සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ දී සිටි රාජ්‍ය සේවයේ තනතුරෙ හි ලබමින් සිටි වැටුප පදනම් කර ගනිමින් පත්වීම් ස්ථිර වනතෙක් වැටුප් ගෙවනු ලැබේ.

*වැටුප් පරිමාණය:* ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථිර පත්වීම් ලබන දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 03/2016 (iv) දරන වැටුප් චක්‍රලේඛයට අනුව GE 01-2016 හි රු. 31,490 -445x6-525x7-600x2-රු.39,035/-(මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I(අ) ශ්‍රේණිය සඳහා මෙම වැටුප් පරිමාණයේ 14 වන වැටුප් පියවර වන රු. 37,835/- වැටුපෙහි පිහිටුවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමිය.

05. *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* :

5.1 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2023.02.10 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

5.1.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපාධියක් සමඟ සටහන 3 හි සඳහන් කර ඇති සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

5.1.2 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂය/ විෂයන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ යුතුය. ඉල්ලුම් කරනු ලබන විෂයට අදාළව ස්වකීය උපාධියේ මුළු විෂය සන්ධාරයෙන් (Credit සංඛ්‍යාවෙන්) 1/3 ක් සම්පූර්ණ කළ අයවලුන් විය යුතුය.

*ඉතා වැදගත්*:- ඉහත 5.1.1 හා 5.1.2 කොන්දේසිවලට අමතර වශයෙන් ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත කරුණු සැලකිල්ලට ගත යුතු ය.

- ස්වකීය උපාධියට අනුව ඉල්ලුම් කළ හැකි විෂයයන් පිළිබඳව අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතු ය.
- උසස් පෙළ හා සාමාන්‍ය පෙළ විෂය නිර්දේශයන්ට අදාළ ව උපාධියෙහි පවතින විෂය සන්ධාරයන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී සලකා බලනු ලැබේ.
- ඉල්ලුම් කරනු ලබන විෂයට අදාළව ප්‍රධාන විෂයක් සහිත උපාධි නොමැති අවස්ථාවන්හි දී ලබා ඇති උපාධිය සමඟ අමතර සුදුසුකම් ද සලකා බලනු ලැබේ.
- උපාධියෙහි විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයෙහි (Transcript) විෂය සන්ධාරය (credit සංඛ්‍යාව) සඳහන් නොවේ නම් එය අදාළ විශ්වවිද්‍යාලය මගින් තහවුරු කර අදාළ ලේඛන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.
- උපාධියෙහි විෂය සන්ධාරය පිළිබඳව ඇතිවන ගැටලු සම්බන්ධයෙන් අවසන් තීරණය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්/පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා සතු වේ.
- පාසල් පද්ධතියේ පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ දී අදියර දෙකක් (2) වශයෙන් ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සලකා බලනු ලබන බැවින් එක් අයදුම්කරුවකු අ.පො.ස. (උසස් පෙළ) හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ වූ විෂයන් කාණ්ඩයෙන් විෂයන් දෙකක් හා අ.පො. ස (සා.පෙළ) හා අනෙකුත් විෂයන් කාණ්ඩයෙන් දෙකක් සඳහා ඉල්ලුම් කළ හැකිය.
- මෙහි දී අ.පො.ස. (උසස් පෙළ) හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ වූ විෂයන් කාණ්ඩය සඳහා බඳවා ගැනීමට ප්‍රමුඛතාව ලබා දී කටයුතු කරනු ලැබේ.

5.1.3 ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව සෑම අයදුම්කරුවකුම අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයක් වශයෙන් සමත් වී තිබිය යුතුය. විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස. (සා.පෙළ) විභාගය හා සමානව පිළිගනු ලබන වෙනත් විභාග සමතුන්ට ද මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

*සටහන 3*.- පහත සඳහන් පරිදි එක් එක් විෂයය සම්බන්ධයෙන් එහි දක්වා ඇති සුදුසුකම් අවම සුදුසුකම් ලෙස සලකනු ලැබේ.

1. අ.පො.ස (උසස් පෙළ) විෂයයන් හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ වූ

| *විෂය කේත අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 101 | රසායන විද්‍යාව Chemistry | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂය ලෙස,<br>හෝ<br>අනෙක් විෂයක් ලෙස උපාධියේ මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් අ.පො.ස. (උසස් පෙළ) විෂය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම,<br>හෝ<br>තුන් අවුරුදු උපාධියක දී මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් අවම වශයෙන් අදාළ විෂයෙන් සම්පූර්ණ කර තිබීම. |

| විෂය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 102 | භෞතික විද්‍යාව Physics | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂය ලෙස,<br>හෝ<br>අනෙක් විෂයක් ලෙස උපාධියේ මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් අ.පො.ස. (උසස් පෙළ) විෂය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම,<br>හෝ<br>තුන් අවුරුදු උපාධියක දී මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් අවම වශයෙන් අදාළ විෂයයෙන් සම්පූර්ණ කර තිබීම. |
| 103 | ජීව විද්‍යාව Biology | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂය ලෙස උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව හෝ සත්ව විද්‍යාව හදාරා තිබීම හා ප්‍රධාන විෂය උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව වනවිට අනෙක් විෂයක් ලෙස සත්ත්ව විද්‍යාව ද ප්‍රධාන විෂය සත්ත්ව විද්‍යාව වන විට අනෙක් විෂයක් ලෙස උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව ද අවම වශයෙන් වසර දෙකක දී වත් උසස් පෙළ විෂය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම,<br>හෝ<br>තුන් අවුරුදු සාමාන්‍ය උපාධියක දී උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව හා සත්ව විද්‍යාව යන විෂයන් දෙකෙහිම එකතුව, මුළු විෂය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක බැගින් උසස් පෙළ විෂය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම. |
| 104 | කෘෂි විද්‍යාව Agricultural Science | විද්‍යාවේදී කෘෂි තාක්ෂණය හා කළමනාකරණ උපාධිය (B.Sc. Agricultural Technology and Management)<br>විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය (B.Sc. Agriculture)<br>විද්‍යාවේදී කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණ උපාධිය (B.Sc. Agricultural Resources Management and Technology)<br>විද්‍යාවේ දී කෘෂි ව්‍යාපාර කළමනාකරණ උපාධිය (B.Sc. Agri Business Management)<br>විද්‍යාවේ දී අපනයන කෘෂිකර්ම උපාධිය (B.Sc. Export Agriculture)<br>ඉහත නම් සඳහන් උපාධි,<br>හෝ<br>උසස් පෙළ කෘෂි විද්‍යාව විෂය නිර්දේශයට අනුකූල වන පරිදි මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් ආවරණය වන විෂයන් අන්තර්ගත වන ඕනෑම විද්‍යාවේදී උපාධියක් හදාරා තිබීම. |
| 105 | සංයුක්ත ගණිතය Combined Mathematics | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂය ලෙස ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය හදාරා තිබීම හා ප්‍රධාන විෂය ව්‍යවහාරික ගණිතය වන විට අනෙක් විෂය ලෙස ශුද්ධ ගණිතය ද ප්‍රධාන විෂය ශුද්ධ ගණිතය වන විට අනෙක් විෂය ලෙස ව්‍යවහාරික ගණිතය ද අවම වශයෙන් වසර දෙකක දී වත් හදාරා තිබීම,<br>හෝ<br>තුන් අවුරුදු සාමාන්‍ය උපාධියක දී ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයන් දෙකෙහි ම එකතුව, මුළු විෂය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක බැගින් හදාරා තිබීම |
| 106 | ඉංජිනේරු තාක්ෂණවේදය Engineering Technology | උපාධියෙහි මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් සහිතව ඉදිකිරීම්, යාන්ත්‍රික, විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් යන විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි උපාධිය සම්පූර්ණ කර තිබීම,<br>හෝ<br>ඉංජිනේරු උපාධිය (ඉදිකිරීම්, යාන්ත්‍රික, විදුලි හා/හෝ ඉලෙක්ට්‍රොනික්) ලබා තිබීම. |

| විෂය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 107 | ජෛව පද්ධති තාක්ෂණවේදය Bio Systems Technology | විද්‍යාවේදී කෘෂි තාක්ෂණය හා කළමනාකරණ උපාධිය (B.Sc. Agricultural Technology and Management),<br>විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය (B.Sc. Agriculture),<br>විද්‍යාවේදී කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණ උපාධිය (B.Sc. Agricultural Resources Management and Technology) ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය (BBST),<br>ඉහත නම් සඳහන් උපාධි,<br>හෝ<br>උසස් පෙළ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය නිර්දේශයට අනුකූල වන පරිදි මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් ආවරණය වන විෂයන් අන්තර්ගත වන ඕනෑම විද්‍යාවේදී උපාධියක් හදාරා තිබීම. |
| 108 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව Science for Technology | විද්‍යාවේදී උපාධියෙ හි පවතින මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් භෞතික විද්‍යාව අන්තර්ගත වන උපාධියක් හදාරා තිබීම |
| 109 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය Information & Communication Technology | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විශේෂ උපාධියක්,<br>හෝ<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස ඇති උපාධියක්. උපාධි පාඨමාලාවට අයත් මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයට අයත් විය යුතුය. |
| 110 | ගිණුම්කරණය Accounting | ගිණුම්කරණය පිළිබඳ විශේෂ උපාධියක්,<br>හෝ<br>ගිණුම්කරණය ප්‍රධාන විෂයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 111 | ව්‍යාපාර අධ්‍යයනය Business Studies | ව්‍යාපාර අධ්‍යයනය හෝ ව්‍යාපාර කළමනාකරණයට අදාළ විෂයක් ප්‍රධාන විෂයක්වන ඕනෑම උපාධියක් ලබා තිබීම. |
| 112 | ව්‍යාපාර සංඛ්‍යානය Business Statistics | ව්‍යාපාර සංඛ්‍යානය ප්‍රධාන විෂයක් වන,<br>හෝ<br>සංඛ්‍යානය විෂය ඇතුළත් වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම. |
| 113 | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය Logic and Scientific Method | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>දර්ශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 114 | ආර්ථික විද්‍යාව Economics | ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක්,<br>හෝ<br>ආර්ථික විද්‍යාව ප්‍රධාන විෂයක් වන වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම. |
| 115 | භූගෝල විද්‍යාව Geography | භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |

| විෂය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 116 | දේශපාලන විද්‍යාව Political Science | දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>දේශපාලන විද්‍යාව ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 117 | ගෘහ ආර්ථික විද්‍යාව Home Economics | ගෘහ ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් හදාරා තිබීම,<br>හෝ<br>ඕනෑම උපාධියක් සමග අවු.2 ක් හෝ ඊට වැඩි පාඨමාලා කාලයක් සහිතව අවම වශයෙන් NVQ 4 හෝ ඊට ඉහළ මට්ටමේ ගෘහ විද්‍යා ඩිප්ලෝමාවක් ලබා තිබීම,<br>හෝ<br>ඕනෑම උපාධියක් සමඟ අ.පො.ස (උසස් පෙළ) සඳහා ගෘහ ආර්ථික විද්‍යාව විෂය හදාරා A හෝ B සාමර්ථ්‍යය ලබා තිබීම. |
| 118 | ඉතිහාසය (ලංකා ඉතිහාසය සමඟ ඉන්දීය/යුරෝපා/නූතන ලෝක) History of Sri Lanka/Indian/Europe / Contemporary) | ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>ඉතිහාසය ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 119 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය Communication & Media Studies | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 120 | බෞද්ධ ශිෂ්ටාචාරය Buddhist Civilization | බෞද්ධ ශිෂ්ටාචාරය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ අධ්‍යයනය, බෞද්ධ දර්ශනය සහ පාලි යන විෂයන්ගෙන් එක් විෂයක් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් සමත්වීම. |
| 121 | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය Christian Civilization | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය, ක්‍රිස්තියානි ධර්මය විෂය සහිත සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම. |
| 122 | හින්දු ශිෂ්ටාචාරය Hindu Civilization | හින්දු ශිෂ්ටාචාරය, හින්දු ධර්මය විෂය සහිත සාමාන්‍ය,<br>හෝ<br>විශේෂ උපාධියක් ලබා තිබීම |
| 123 | ඉස්ලාම් ශිෂ්ටාචාරය Islamic Civilization | ඉස්ලාම් ශිෂ්ටාචාරය, ඉස්ලාම් ධර්මය විෂය සහිත සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම |
| 124 | බුද්ධ ධර්මය Buddhism | බෞද්ධ ශිෂ්ටාචාරය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ අධ්‍යයනය බෞද්ධ දර්ශනය සහ පාලි යන විෂයන්ගෙන් එක් විෂයක් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් සමත්වීම |
| 125 | හින්දු ධර්මය Hinduism | හින්දු ශිෂ්ටාචාරය, හින්දු ධර්මය විෂය සහිත සාමාන්‍ය<br>හෝ<br>විශේෂ උපාධියක් ලබා තිබීම. |
| 126 | ක්‍රිස්තියානි ධර්මය Christianity | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය, ක්‍රිස්තියානි ධර්මය විෂය සහිත සාමාන්‍ය හෝවිශේෂ උපාධියක් ලබා තිබීම. |
| 127 | ඉස්ලාම් Islam | ඉස්ලාම් ශිෂ්ටාචාරය, ඉස්ලාම් ධර්මය විෂය සහිත සාමාන්‍ය,<br>හෝ<br>විශේෂ උපාධියක් ලබා තිබීම. |

| *විෂය කේත අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 128 | චිත්‍ර කලාව Art | චිත්‍ර කලා/ මූර්ති විෂය සහ අදාළ විෂය පිළිබඳ දෘෂ්‍ය කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>චිත්‍ර කලා/ මූර්ති විෂය සහ අදාළ විෂය පිළිබඳ ලලිත කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් විදේශීය විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සඳහා ලබා ඇති උපාධියක් ලබා තිබීම |
| 129 | නර්තනය (දේශීය)<br>Dancing (Traditional) | අදාළ විෂය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සඳහා ලබා ඇති, ප්‍රාසාංගික කලා / ලලිත කලා/ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක් ලබා තිබීම (පත්වීම් බලධාරියා විසින් පවත්වනු ලබන දේශීය නර්තන කුසලතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වීමේ කොන්දේසිය යටතේ) |
| 130 | නර්තනය (භරත)<br>Dancing (Bharatha) | අදාළ විෂය යටතේ ලබා ඇති ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සඳහා ලබා ඇති, ප්‍රාසාංගික කලා/ලලිත කලා/ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම |
| 131 | පෙරදිග සංගීතය<br>Oriental Music | අදාළ විෂය යටතේ ලබා ඇති ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සඳහා ලබා ඇති, ප්‍රාසාංගික කලා/ලලිත කලා/ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම. |

| විෂය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 132 | කර්ණාටක සංගීතය Carnatic Music | අදාළ විෂය යටතේ ලබා ඇති ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සඳහා ලබා ඇති, ප්‍රාසාංගික කලා / ලලිත කලා/ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම |
| 133 | බටහිර සංගීතය Western Music | අදාළ විෂය යටතේ ලබා ඇති ප්‍රාසාංගික කලා /ලලිත කලා/ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක්,<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් විදේශීය විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සඳහා ලබා ඇති උපාධියක් ලබා තිබීම. |
| 134 | නාට්‍ය හා රංගකලාව<br>Drama & Theatre | අදාළ විෂය යටතේ ලබා ඇති ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සඳහා ලබා ඇති, ප්‍රාසාංගික කලා/ලලිත කලා/ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක් ලබා තිබීම |
| 135 | සිංහල Sinhala | සිංහල පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>සිංහල ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 136 | දෙමළ Tamil | දෙමළ පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>දෙමළ ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 137 | ඉංග්‍රීසි English | ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>ඉංග්‍රීසි ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 138 | අරාබි Arabic | අදාළ විෂය ප්‍රධාන විෂයක් ලෙස හදාරණු ලැබූ විදේශ භාෂා උපාධියක් හෝ අදාළ විෂයට විශේෂ උපාධියක් ලබා තිබීම |
| 139 | ප්‍රංශ French | |
| 140 | චීන Chinese | |
| 141 | ජපන් Japanese | |
| 142 | ජර්මන් German | |
| 143 | රුසියන් Russian | |
| 144 | මැලේ Malay | |
| 145 | හින්දි Hindi | |
| 146 | කොරියන් Korean | |

| *විෂය කේත අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 201 | ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය Child Psychology and Care | ළමා මනෝ විද්‍යාව විෂයක් ලෙසට හැදෑරූ උපාධියක්,<br>හෝ<br>ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 202 | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය Health and Social Care | සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 203 | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා Physical Education and Sport | විද්‍යාවේදී (ශාරීරික අධ්‍යාපනය) විශේෂ උපාධිය,<br>හෝ<br>ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 204 | ප්‍රාසාංගික කලාව Performing Arts | ප්‍රාසාංගික කලා පිළිබඳ විශේෂ උපාධිය,<br>හෝ<br>ශාස්ත්‍රවේදී-විශේෂ (ප්‍රාසාංගික කලා/ලලිත කලා/නර්තනය/සංගීතය) උපාධිය,<br>හෝ<br>නාට්‍ය හා රංග කලාව පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය,<br>හෝ<br>අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංග කලාව) උපාධිය,<br>හෝ<br>ප්‍රාසාංගික කලාව හෝ ලලිත කලාව ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ විශේෂ උපාධියක් ලබා තිබීම. |
| 205 | කාර්ය සිද්ධි කළමනාකරණය Event Management | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ කාර්ය සිද්ධි කළමනාකරණය පිළිබඳ කළමනාකරණ උපාධිය,<br>හෝ<br>කාර්ය සිද්ධි කළමනාකරණය ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත් උපාධියක් ලබා තිබීම. |
| 206 | ශිල්ප කලා Arts and Crafts | දෘශ්‍ය කලා විශේෂ උපාධිය (චිත්‍ර, මූර්ති, මුද්‍රණ කලා, රෙදිපිළි හා රෙදිපිළි ආශ්‍රිත කලා ආදී)<br>හෝ<br>දෘශ්‍ය කලා හා සැලසුම්කරණය විශේෂ උපාධිය (චිත්‍ර කලා සහ ග්‍රැෆික්),<br>හෝ<br>දෘශ්‍ය හා තාක්ෂණ කලා විශේෂ උපාධිය<br>හෝ<br>ශාස්ත්‍රවේදී හෝ ලලිත කලාවේදී විශේෂ උපාධියක්ලබා තිබීම (චිත්‍ර කලා/ග්‍රැෆික්/මූර්ති/දෘෂ්‍ය හා තාක්ෂණික කලා යන විෂයන් හෝ එක් විෂයක් හෝ ප්‍රධාන ලෙස හදාරා තිබිය යුතුය) |
| 207 | අභ්‍යන්තර නිර්මාණකරණය Interior Designing | ගෘහ නිර්මාණ ශිල්පය සඳහා වූ විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>නිර්මාණවේදී උපාධිය<br>හෝ<br>ගෘහ නිර්මාණ ශිල්පය සඳහා පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය<br>හෝ<br>අභ්‍යන්තර නිර්මාණකරණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |

| විෂය ක්ෂේත්‍ර අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 208 | විලාසිතා නිර්මාණකරණය<br>Fashion Designing | දෘශ්‍ය කලා විශේෂ උපාධිය (රෙදිපිළි හා ඇඟලුම් කලා),<br>හෝ<br>නිර්මාණවේදී උපාධිය,<br>හෝ<br>විලාසිතා නිර්මාණකරණය සහ නිපැයුම් ප්‍රවර්ධනය පිළිබඳ උපාධිය,<br>හෝ<br>විලාසිතා නිර්මාණකරණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 209 | ග්‍රැෆික් නිර්මාණකරණය<br>Graphic Designing | නිර්මාණවේදී උපාධිය,<br>හෝ<br>දෘශ්‍ය කලා හා සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (චිත්‍ර සහ ග්‍රැෆික්),<br>හෝ<br>පරිගණක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය,<br>හෝ<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය,<br>හෝ<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය,<br>හෝ<br>උපාධියට ප්‍රධාන විෂයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය ඇතුළත් උපාධියක්<br>හෝ<br>පරිගණක විද්‍යාව විෂය ඇතුළත් විද්‍යාවේදී උපාධිය<br>හෝ<br>(ඉහත සඳහන් උපාධි පාඨමාලාවේ මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක වටිනාකමකින් යුතු ග්‍රැෆික් නිර්මාණකරණය සහිත විෂය කොටස් හදාරා සමත් වී තිබිය යුතුය.)<br>ග්‍රැෆික් නිර්මාණකරණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 210 | භූ දර්ශන නිර්මාණකරණය<br>Landscaping | කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියක දී උද්‍යාන විද්‍යාව/භූ දර්ශන නිර්මාණකරණය විෂයක් වශයෙන් හදාරා තිබීම,<br>හෝ<br>භූ දර්ශන නිර්මාණකරණය ප්‍රධාන විෂයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |
| 211 | ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය Applied Horticultural Studies | කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියක දී උද්‍යාන විද්‍යාව/ භූ දර්ශන නිර්මාණකරණය විෂයක් වශයෙන් හදාරා තිබීම,<br>හෝ<br>ව්‍යවහාරික උද්‍යාන විද්‍යාව ප්‍රධාන විෂයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |

| *විෂය කේත අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 212 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය Livestock Product Studies | කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියක දී සත්ත්ව විද්‍යාව/පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය විශේෂීකරණය සහිතව හදාරා තිබීම,<br>හෝ<br>සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය,<br>හෝ<br>සත්ත්ව නිෂ්පාදන හා ආහාර තාක්ෂණය/පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය ප්‍රධාන විෂයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |
| 213 | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය Food Processing Studies | ආහාර විද්‍යාව හා තාක්ෂණය උපාධිය,<br>හෝ<br>ආහාර විද්‍යා හා පෝෂණය පිළිබඳ උපාධිය,<br>හෝ<br>කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියකදී ආහාර විද්‍යාව/ ආහාර නිෂ්පාදන තාක්ෂණය විශේෂීකරණය සහිතව හදාරා තිබීම<br>හෝ<br>ආහාර නිෂ්පාදන තාක්ෂණය හෝ ආහාර සැකසුම් තාක්ෂණවේදය ප්‍රධාන විෂයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |
| 214 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය Aquatic Resource Studies | ජලජ සම්පත් කළමනාකරණය හා සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියකදී සත්ත්ව විද්‍යාව/පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය/ජලජ සම්පත් තාක්ෂණය විෂයක් වශයෙන් හදාරා තිබීම,<br>හෝ<br>සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>ධීවර හා සාගර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>ජලජ සම්පත් තාක්ෂණය ප්‍රධාන විෂයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |
| 215 | වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය Plantation Product Studies | අපනයන කෘෂිකර්මය පිළිබඳ උපාධිය,<br>හෝ<br>කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියකදී වැවිලි භෝග/වැවිලි බෝග නිෂ්පාදනය තාක්ෂණය විෂයක් වශයෙන් හදාරා තිබීම,<br>හෝ<br>වැවිලි බෝග නිෂ්පාදන තාක්ෂණය විෂයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |

| *විෂය කේත අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 216 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය Construction Studies | සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>ඉදිකිරීම් හා ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය ඇතුළත් ඉංජිනේරු තාක්ෂණවේ දී උපාධිය,<br>හෝ<br>තාක්ෂණවේදී උපාධිය,<br>හෝ<br>ඉදිකිරීම් තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ වෙනත් ඕනෑම උපාධියක් හෝ ඕනෑම උපාධියක් සමඟ අවු. 2 ක් හෝ ඊට වැඩි පාඨමාලා කාලයක් සහිතව හෝ අවම වශයෙන් NVQ 4 හෝ ඊට ඉහළ මට්ටමේ ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| 217 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය Automobile Studies | තාක්ෂණවේදී උපාධිය (මෝටර් යාන්ත්‍රික),<br>හෝ<br>විද්‍යාවේදී ඉංජිනේරු (මෝටර් යාන්ත්‍රික) උපාධිය,<br>හෝ<br>මෝටර් යාන්ත්‍රික තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 218 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය Electrical and Electronic Studies | විදුලි ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය,<br>හෝ<br>ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය<br>හෝ<br>විදුලි හෝ ඉලෙක්ට්‍රොනික තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 219 | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය Textile and Apparel Studies | නිර්මාණවේදී උපාධිය,<br>හෝ<br>පේෂකර්ම හා රෙදිපිළි පිළිබඳ ඉංජිනේරු විද්‍යා ප්‍රථම උපාධිය,<br>හෝ<br>තාක්ෂණවේදී උපාධිය,<br>හෝ<br>පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 220 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය Metal Fabrication Studies | තාක්ෂණවේදී උපාධිය (යාන්ත්‍රික),<br>හෝ<br>යාන්ත්‍රික තාක්ෂණවේදය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ සාමාන්‍ය උපාධිය,<br>හෝ<br>ලෝහ සැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් හෝ ඕනෑම උපාධියක් සමඟ අවම වශයෙන් NVQ 3 හෝ ඊට ඉහළ මට්ටමේ ලෝහ සැකසුම් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම. |

| *විෂය ක්ෂේත්‍ර අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 221 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය Aluminum Fabrication Studies | තාක්ෂණවේදී උපාධිය (සිවිල් / ඉදිකිරීම්/ යාන්ත්‍රික),<br>හෝ<br>ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක්,<br>හෝ<br>ඕනෑම උපාධියක් සමඟ අවම වශයෙන් NVQ 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| 222 | පරිගණක දෘඩාංග සහ ජාලකරණය Computer Hardware and Networking | වසර තුනක පාඨමාලා කාලයකින් යුක්ත තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය (එම උපාධිය සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විෂය කොටස් හදාරා තිබීම),<br>හෝ<br>වසර හතරක කාලයකින් යුක්ත තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය (එම උපාධිය සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විෂය කොටස් හදාරා තිබීම),<br>හෝ<br>පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී/ තාක්ෂණවේදී උපාධියක් ලබා තිබීම හා එහි මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක වටිනාකමක් සහිතව පහත සඳහන් විෂය ක්ෂේත්‍ර හදාරා සමත් වී තිබීම.<br>විෂය ක්ෂේත්‍ර<br>i) Computer Hardware<br>ii) Computer system Engineering<br>iii) Computer Networks<br>iv) Computer Architecture<br>v) Operating System<br>vi) Electronics<br>vii) Arduino Technology<br>viii) IT Security<br>ix) Network Security<br>x) Information Security<br>xi) Cyber Security<br>xii) Computer Hardware and Network related projects |
| 223 | නිෂ්පාදනය Manufacturing | වසර තුනක කාලයකින් යුත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උපාධියක් ලබා තිබීම. |
| 224 | සංචරණය හා ආගන්තුක සත්කාර Tourism & Hospitality | විද්‍යාවේදී සංචාරක කළමනාකරණ විශේෂ උපාධිය,<br>හෝ<br>විද්‍යාවේදී සත්කාරක සේවා කළමනාකරණ විශේෂ උපාධිය,<br>හෝ<br>ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණය පිළිබඳව පරිපාලනවේදී උපාධිය,<br>හෝ<br>ආගන්තුක සත්කාර සංචාරක ව්‍යාපාර සිද්ධි පිළිබඳ කළමනාකරණ උපාධිය,<br>හෝ<br>සංචාරක කළමනාකරණ විශේෂවේදී උපාධිය,<br>හෝ<br>සංචාරක කළමනාකරණ උපාධිය,<br>හෝ<br>සංචාරක සහ සංස්කෘතික සම්පත් කළමනාකරණ උපාධිය,<br>හෝ<br>සංචරණය හා ආගන්තුක සත්කාර ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |

| *විෂය කේත අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 225 | සැපයුම් කළමනාකරණය Logistic Management | උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස සැපයුම් කළමනාකරණය විෂය හදාරා තිබීම. |
| 226 | අලෙවිකරණය Marketing | අලෙවි කළමනාකරණය පිළිබඳව හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳව හෝ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව හෝ කළමනාකරණය පිළිබඳ උපාධිය,<br>හෝ<br>වාණිජවේදී උපාධිය හෝ ප්‍රධාන විෂයයක් ලෙස අලෙවි කළමනාකරණය ඇතුළත් උපාධියක් ලබා තිබීම. |

**2. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හා අනෙකුත් විෂයයන්**

| | | |
|---|---|---|
| 301 | ශිෂ්‍ය උපදේශනය Counselling | මනෝ විද්‍යාව/සමාජ විද්‍යාව පිළිබඳව විශේෂවේදී උපාධියක් ලබා තිබීම,<br>හෝ<br>මනෝ විද්‍යාව/සමාජ විද්‍යාව පිළිබඳව සමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම,<br>හෝ<br>ඕනෑම උපාධියක් සමඟ,<br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් හෝ තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් ආයතනයකින් ලබා ගත් එක් අවුරුද්දකට නොඅඩු උපදේශනය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක්,<br>හෝ<br>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් හෝ තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් ආයතනයකින් ලබා ගත් උපදේශනය පිළිබඳ වසරකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම |
| 302 | විශේෂ අධ්‍යාපනය Special Education | විශේෂ අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ උපාධියක්,<br>හෝ<br>අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ උපාධියක්,<br>හෝ<br>විද්‍යාවේදී කථන හා ශ්‍රවණ විද්‍යා උපාධියක් තිබීම. |

| | | |
|---|---|---|
| 401 | විද්‍යාව Science | රසායන විද්‍යාව, භෞතික විද්‍යාව,සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් ඕනෑම විෂයයන් 03ක් උපාධි විෂයයන් ලෙස සමත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |
| 402 | ගණිතය Mathematic | විද්‍යාවේදී උපාධිය (භෞතීය විද්‍යා),<br>හෝ<br>ප්‍රධාන විෂයන්ට අන්තර්ගතව ගණිත සංරචක ආශ්‍රිත විෂයයන් අවම වශයෙන් මුළු විෂය සන්ධාරයෙන් (Credit සංඛ්‍යාවෙන්) 1/3ක් වන ලෙස ඇතුළත්ව තිබීම. |
| 403 | සිංහල භාෂාව හා සාහිත්‍යය Sinhala language & Literature | සිංහල පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>සිංහල ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |

| විෂය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 404 | දෙමළභාෂාව හා සාහිත්‍යය Tamil language & Literature | දෙමළ පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>දෙමළ ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 405 | ඉංග්‍රීසි භාෂාව English | ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>ඉංග්‍රීසි ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 406 | ඉතිහාසය History | ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>ඉතිහාසය ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 407 | භූගෝල විද්‍යාව Geography | භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 408 | පුරවැසි අධ්‍යාපනය Civic Education | ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය (පුරුවැසි අධ්‍යයනය හා ප්‍රජා පාලනය/දේශපාලන විද්‍යාව),<br>හෝ<br>ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය (පුරවැසි අධ්‍යයනය හා ප්‍රජා පාලනය/දේශපාලන විද්‍යාව) ඇතුළුව ලබා තිබීම. |
| 409 | ව්‍යාපාර හා ගිණුම්කරණය අධ්‍යයනය Business & Accounting Studies | වානිජ විෂය ධාරාවට අයත් ඕනෑම උපාධියක් ලබා තිබීම. |
| 410 | ව්‍යවසායකත්ව අධ්‍යයනය Entrepreneurship Studies | වානිජ විෂය ධාරාවට අයත් ඕනෑම උපාධියක් ලබා තිබීම. |
| 411 | ප්‍රංශ French | ප්‍රංශ භාෂාව ප්‍රධාන විෂයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම. |
| 412 | හින්දි Hindi | හින්දි භාෂාව ප්‍රධාන විෂයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම. |
| 413 | ජපන් Japanese | ජපන් භාෂාව ප්‍රධාන විෂයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම. |
| 414 | අරාබි Arabic | අරාබි භාෂාව ප්‍රධාන විෂයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම. |
| 415 | ජර්මන් German | ජර්මන් භාෂාව ප්‍රධාන විෂයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම. |
| 416 | චීන Chinese | චීන භාෂාව ප්‍රධාන විෂයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම. |
| 417 | රුසියන් Russian | රුසියන් භාෂාව ප්‍රධාන විෂයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම. |
| 418 | කොරියන් Korean | කොරියන් භාෂාව ප්‍රධාන විෂයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම. |

| *විෂය කේත අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 419 | දෙවන භාෂාව (සිංහල)<br>2nd language Sinhala | ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය,<br>හෝ<br>සාමාන්‍ය උපාධිය හා දෙවන භාෂාවක් ලෙස සිංහල නම් අ.පො.ස. (සා.පෙළ) සඳහා දෙමළ විෂයයක් ලෙස කර තිබිය යුතු අතර අවම වශයෙන් සම්මාන සාමර්ථයක් ලබා තිබීම. |
| 420 | දෙවන භාෂාව (දෙමළ)<br>2nd language Tamil | ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය,<br>හෝ<br>සාමාන්‍ය උපාධිය හා දෙවන භාෂාවක් ලෙස දෙමළ නම් අ.පො.ස. (සා.පෙළ) සඳහා සිංහල විෂයක් ලෙස කර තිබිය යුතු අතර අවම වශයෙන් සම්මාන සාමර්ථයක් ලබා තිබීම. |
| 421 | සංගීතය( පෙරදිග)<br>Music (Oriental) | අදාළ විෂය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සඳහා ලබා ඇති, ප්‍රාසංගික කලා / ලලිත කලා/ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම. |
| 422 | සංගීතය (අපරදිග)<br>Music (Western) | අදාළ උපාධිය හා අ.පො.ස උසස් පෙළ විභාගයේ බටහිර සංගීතය විෂය සඳහා A හෝ B සාමර්ථයක් ලබා තිබීම.<br>හෝ<br>අදාළ උපාධිය සමඟ පහත සුදුසුකම්වලින් අවම වශයෙන් එක් සුදුසුකමක් සපුරා තිබීම.<br>Pass in Grade VI or above in Practical and Theory exams conducted by one the following institutions.<br>• Department of Examinations, Sri Lanka<br>• Trinity College of Music, London<br>• Royal Schools of Music, London<br>• London College of Music<br>• Institute of Western Music and Speech "Sri Lanka (IWMS) |
| 423 | සංගීතය (කර්ණාටක)<br>Music (Carnatic) | අදාළ විෂය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්,<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සඳහා ලබා ඇති, ප්‍රාසංගික කලා / ලලිත කලා/ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම. |

| *විෂය කේත අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 424 | චිත්‍ර Art | චිත්‍ර කලා/ මූර්ති විෂය සහ අදාළ විෂය පිළිබඳ දෘෂ්‍ය කලාවේදී (විශේෂ) උපාධිය<br>හෝ<br>චිත්‍ර කලා/ මූර්ති විෂය සහ අදාළ විෂය පිළිබඳ ලලිත කලාවේදී (විශේෂ) උපාධිය<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් විදේශීය විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සඳහා ලබා ඇති උපාධියක්<br>හෝ<br>අදාළ සාමාන්‍ය උපාධියේ මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් චිත්‍ර විෂය සහිතව හා අ.පො.ස උසස් පෙළ චිත්‍ර කලා විෂය සඳහා A හෝ B සාමර්ථ්‍යයක් ලබා තිබීම |
| 425 | නැටුම් (දේශීය)<br>Dancing (Oriental) | අදාළ විෂය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සඳහා ලබා ඇති, ප්‍රාසංගික කලා / ලලිත කලා/ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක් ලබා තිබීම (පත්වීම් බලධාරියා විසින් පවත්වනු ලබන දේශීය නර්තන කුසලතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වීමේ කොන්දේසිය යටතේ) |
| 426 | නැටුම් (භරත)<br>Dancing (Bharatha) | අදාළ විෂය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය<br>හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සඳහා ලබා ඇති,ප්‍රාසංගික කලා / ලලිත කලා/ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම |
| 427 | නාට්‍ය හා රංග කලාව (සිංහල/දෙමළ)<br>Drama and Theatre | අදාළ විෂය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය<br>හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සඳහා ලබා ඇති, ප්‍රාසාංගික කලා / ලලිත කලා/ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක් ලබා තිබීම |

| *විෂය කේත අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 428 | සාහිත්‍ය හා රසාස්වාදය (සිංහල) Appreciation of Literary (Sinhala) | සිංහල පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ ) උපාධියක්<br>හෝ<br>සිංහල ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 429 | සාහිත්‍ය හා රසාස්වාදය (දෙමල) Appreciation of Literary (Tamil) | දෙමළ පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ ) උපාධියක්<br>හෝ<br>දෙමළ ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 430 | සාහිත්‍ය හා රසාස්වාදය (ඉංග්‍රීසී) Appreciation of Literary (English) | ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ ) උපාධියක්<br>හෝ<br>ඉංග්‍රීසි ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 431 | සාහිත්‍ය හා රසාස්වාදය (අරාබි) Appreciation of Literary (Arabic) | අරාබි පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ ) උපාධියක්<br>හෝ<br>අරාබි ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 432 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය Information & communication Technology | තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විශේෂ උපාධියක්<br>හෝ<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රධාන විෂයක් ලෙස ඇති උපාධියක් ලබා තිබීම |
| 433 | කෘෂි හා ආහාර තාක්ෂණය Agriculture & Food Technology | කෘෂිකර්ම පිළිබඳ විද්‍යාවේදී ඕනෑම උපාධියක්<br>හෝ<br>ඕනෑම විද්‍යාවේදී උපාධියක දී/ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධියකදී මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් අවම වශයෙන් කෘෂිකර්ම විෂයෙන් සම්පූර්ණ කර තිබීම |
| 434 | ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය Aquatic Bio resources Technology | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී ඕනෑම උපාධියක්<br>හෝ<br>සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය<br>හෝ<br>ජලජ සම්පත් කළමනාකරණය හා සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>ඕනෑම විද්‍යාවේදී උපාධියකදී මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් අවම වශයෙන් ජලජ ජීව සම්පත් තාක්ෂණය විෂයෙන් සම්පූර්ණ කර තිබීම |
| 435 | ශිල්ප කලා Art and Craft | දෘශ්‍ය කලා විශේෂ උපාධිය (චිත්‍ර, මූර්ති, මුද්‍රණ කලා රෙදිපිළි හා රෙදිපිළි ආශ්‍රිත කලා ආදී)<br>හෝ<br>දෘශ්‍ය කලා හා සැලසුම්කරණය විශේෂ උපාධිය (චිත්‍ර කලා සහ ග්‍රැෆික්)<br>හෝ<br>දෘශ්‍ය හා තාක්ෂණ කලා විශේෂ උපාධිය<br>හෝ<br>ශාස්ත්‍රවේදී හෝ ලලිත කලාවේදී විශේෂ උපාධිය ලබා තිබීම (චිත්‍ර කලා/ග්‍රැපික්/මූර්ති/දෘෂ්‍ය හා තාක්ෂණික කලා යන විෂයන් හෝ එක් විෂයක් හෝ ප්‍රධාන ලෙස හදාරා තිබිය යුතුය). |

| *විෂය කේත අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 436 | ගෘහ ආර්ථික විද්‍යාව Home Economics | ගෘහ ආර්ථික විද්‍යාව සාමාන්‍ය පෙළ A සාමර්ථ්‍යයක් හෝ අ.පො.ස. උසස් පෙළ ගෘහ ආර්ථික විද්‍යා විෂය සඳහා සම්මාන සාමර්ථ්‍යයක් සහිතව සමත් වී තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක උපාධිධරයකු වීම,<br>හෝ<br>ගෘහ ආර්ථික විද්‍යාව සඳහා තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වෘත්තීය පුහුණු ආයතනයකින් අවුරුද්දකට නොඅඩු පාඨමාලාවක් හදාරා ඩිප්ලෝමාව හෝ සහතික පත්‍රය ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන ඕනෑම විෂය ක්ෂේත්‍රයක් යටතේ උපාධිධරයකු වීම,<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක ගෘහ විද්‍යාව විෂය සඳහා උපාධිධරයකු වීම |
| 437 | ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා Practical and Technical Skills | අ.පො.ස උසස් පෙළ විද්‍යාව,ගණිතය, තාක්ෂණවේදය විෂය ධාරාවෙන් අවම වශයෙන් විෂයයන් 03ක් සමත් වී තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් උපාධිධරයකු වීම |
| 438 | නිර්මාණකරණය හා තාක්ෂණය Design and Technology | අදාළ විෂය ක්ෂේත්‍රයේ තාක්ෂණවේදී/ඉංජිනේරු උපාධිය ලබා තිබීම හා පාඨමාලා අන්තර්ගතයෙන් අවම වශයෙන් 1/3 ක් විෂයානුබද්ධ හැදෑරීම් සහිත වීම,<br>හෝ<br>ජාතික තාක්ෂණ සහතික පත්‍රය, ජාතික උසස් තාක්ෂණ ඩිප්ලෝමාව හෝ තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක ඊට සමාන්තරව එක් අවුරුද්දකට නොඅඩු විෂයානුබද්ධ කාර්මික ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා ඊට අදාළ සහතිකය ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් උපාධිධරයකු වීම |
| 439 | සෞඛ්‍ය හා ශාරිරික අධ්‍යාපනය Health and Physical Education | විද්‍යාවේදී (ශාරීරික අධ්‍යාපනය) ගෞරව උපාධිය,<br>හෝ<br>ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය ලබා තිබීම |
| 440 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය Communication and Media Studies | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ ) උපාධියක්,<br>හෝ<br>සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |

5.1.4. *වයස් සීමාව :*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුය.
(ඒ අනුව **2005.02.10** දිනට හෝ ඊට පෙර හා **1983.02.10** දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

5.1.5. *අනෙකුත් අවශ්‍යතා :*

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙ හි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

06. *අයදුම්කිරීමේ ක්‍රම :*

6.1 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපතේ මුද්‍රිත පිටපතක් ලියාපදිංචි තැපෑලෙන් ද යොමු කළ යුතුය. එම පිටපත් දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදු කරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශවීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දැනුම් දෙනු ලැබේ.

මාර්ගගත අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.2 *විභාග පරිපාටිය :*

6.2.1 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

6.2.2 මෙම බඳවා ගැනීම් නිවේදනයේ අවසානයේ වන උපලේඛන 04 හි දක්වා ඇති නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් විභාගය පැවැත්වේ.අයදුම්කරු විසින් ඉල්ලුම් කරනු ලබන නගර උපලේඛන 04 අනුව ම විය යුතු අතර ඉල්ලුම් කරන ලද නගරය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහි ම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

6.2.3 සෑම අයදුම්කරුවකු ම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. විභාගය සඳහා පෙනී සිටින භාෂා මාධ්‍ය (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) පත්වීම් විෂයෙහි මාධ්‍ය ලෙස සැලකේ.

6.2.4 අයදුම්කරුවකුට ස්වකීය අයදුම්පතේ දැක්වෙන විෂය, විෂය සඳහා මනාප අනුපිළිවෙළ, ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය, විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

6.2.5 විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වේ. සෑම අයදුම්කරුවකුම ප්‍රශ්න පත්‍ර දෙකටම (02)පෙනී සිටිය යුතුය. සාමර්ථ්‍ය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගැනීම අනිවාර්ය වේ.

6.2.6 එක් වරක දී බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

6.3 එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

6.4 අයදුම්පතෙහි ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවකු තම අත්සන තම ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

